**#mediaethicsSL #EnglishPress #lka #TheSundayTimes #November18**

ද සන්ඩේ ටයිම්ස් පුවත්පතෙහි "Angry Sirisena breaks foundations of the pillars of democracy" යන මැයෙන් වූ ලිපියක් ආරම්භ කිරීම සඳහා යොදාගෙන ඇත්තේ, ජනපති සිරිසේනගේ දියණිය වූ චතුරිකා සිරිසේන විසින් ලියූ බවට සඳහන් වන 'ජනාධිපති තාත්තා' චරිතාපදානයෙන් උපුටා ගන්නා ලදැයි සඳහන් කොටසකි. ලිපියේ රචකයා සඳහන් කරන්නේ එම උපුටා ගැනීම සමාජ ජාලයන් ඔස්සේ සංසරණය වූ බවයි. මෙය සැබෑවකි. එවැනි උපුටනයක් සහිත පෝස්ටුවක් පසුගිය දින වලදී සමාජ ජාල මාධ්‍ය ඔස්සේ සංසරණය විණි. නමුත් ගැටළුව වන්නේ සැබවින්ම 'ජනාධිපති තාත්තා' කෘතියේ එවැනි කරුණක් කොතැන හෝ සඳහන් නොවීමයි! වෙනස් ලෙසකින් පවසන්නේ නම් එය සරදමක් ලෙසින් නිර්මාණය කළ සාවද්‍ය තොරතුරු සහිත පෝස්ටුවකි!!

සමාජ ජාලයන් තුළ සෑම විටම නිවැරදි තොරතුරු සංසරණය නොවේ. මෙවැනි පැරඩි වර්ගයේ පෝස්ටු ඕනෑතරම් සමාජ ජාල තුළ දැකගත හැක. නමුත් ද සන්ඩේ ටයිම්ස් වැනි පුවත්පතක් සිය ලිපියක ආරම්භයට එවැනි පෝස්ටුවක අන්තර්ගතය, නිවැරදි මූලාශ්‍ර ඔස්සේ සොයා නොබලා පාදක කරගැනීම යෝග්‍ය වේද? කෙසේ වෙතත් මෙම ලිපියේ වටිනාකමට හෝ ලිපියේ අන්තර්ගත කරුණුවල නිරවද්‍යතාවයට මෙම ආරම්භක ඡේදයේ බලපෑමක් ඇතැයි අපි නොසිතන බවද අවධාරණය කර සිටිමු. මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?